**රණවිරු සේවා අධිකාරිය - 2015**

**---------------------------------**

රණවිරු සේවා අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 9(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.3,322,994 කට මිලදී ගෙන තිබුණු ගෘහ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් රු.23,295 ක් වැඩිපුර ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති රු.90,000 ක නීති ගාස්තු හා අයවිය යුතුව පැවති රු.71,000 ක් වූ වෙසක් කාඩ්පත් අලෙවි ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.15,550 ක රක්ෂණ වන්දි ලැබීම් වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම් ගිණුමට බැර කර තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

2015 වර්ෂයේ රණවිරු දින සැමරුම් උත්සවය සඳහා අධිකාරියේ කාන්තා කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු.281,800 ක් වැයකර මිලදී ගත් නිල ඇඳුම් කට්ටල 38 න් රු.44,495 ක් වටිනා කට්ටල 4 ක් බෙදා දුන් බව සනාථ කෙරෙන ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 8 (1) වගන්තිය | රජයේ සෑම නීතිගත සංස්ථාවක් විසින්ම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර එය අදාල වර්ෂය ආරම්භවීමට මාස තුනකට පෙර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, අධිකාරියේ 2015 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය අනුමත කර |

තිබුණේ 2015 අප්‍රේල් 09 දිනදීය.

| | | |
|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශක සංග්‍රහයේ 8:9:1 වගන්තිය | රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තු සඳහා අධිකාරිය විසින් විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් රණවිරු දින සැමරුම සඳහා රු.1,949,589 ක ශබ්ද විකාශන, පුටු හා මහජන ආවරණ මිලදී ගැනීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**3 මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 44,621,195 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 12,853,444 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 31,767,751 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ දායකය 2014 වර්ෂයේ සිට 2015 වර්ෂය වන විට රු.10,536,581 කින් වර්ධනය වීමට සාපේක්ෂව පුද්ගල පඩිනඩි රු.6,832,819 කින් හා ව්‍යාපෘති මෙහෙයුම් වියදම් රු.28,355,737 කින් වර්ධනය වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.11,402,524 ක්ව පැවති අධිකාරියේ අතිරික්තය 2012 වර්ෂය වන විට රු2,294,684 ක් දක්වා අඩු වී තිබුණි. 2013 වන විට මූල්‍ය ප්‍රතිඵලය රු.12,301,555 ක ඌණතාවයක් ගෙන තිබූ අතර එම ඌනතාවය 2015 වර්ෂය වන විට රු.44,621,195 ක් දක්වා වැඩිවී තිබුණි.

සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.35,677,966 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2012 හා 2013 වර්ෂ වලදී අඛණ්ඩව අඩු වී තිබුණි. 2013 වර්ෂය වන විට රු.14,882,174 ක අගයක් ගෙන තිබූ දායකත්වය 2014 වර්ෂය වන විට රු.21,601,523 දක්වා වැඩි වී තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම අගය නැවත රු.23,353,068 කින් පිරිහී රු.1,751,545 ක සෘණ අගයක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

අධිකාරිය විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියට පරිබාහිරව රු.7,004,309 ක මුදලට විදුලි සෝපානය මිලදී ගෙන සවිකිරීමේ කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පවරා දී තිබුණි. එම කටයුතුවල ප්‍රගතිය නොසළකා 2015 දෙසැම්බර් 31 දින රු.5,461,555 ක මුදලක් යුධ හමුදා සුබසාධක අරමුදලට ගෙවා තිබුණු අතර 2016 සැප්තැම්බර් 21 විගණන දින වන විටත් මෙම විදුලි සෝපානය භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඩු ආදායම්ලාභී රණවිරුවන් හා යැපෙන්නන් වෙනුවෙන් උපැස් යුගල ලබා දීමේ වැඩසටහන 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු අතර එය තවදුරටත් යාවත්කාලීන කිරීම සුදුසු බව රණවිරු සුහසාධනය සඳහා වූ මනෝසමාජීය ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද 2015 පෙබරවාරි 24 දිනැති ලිපිය මගින් අනාවරණය කර තිබුණි. කෙසේ වෙතත්, රණවිරු සුහසාධනය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් තොරව මෙම වැඩසටහන 2015 වර්ෂය තුළදී නවතා දමා තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී අධිකාරියේ නිලධාරීන්ට අවස්ථා 5 කදී ලබා දී තිබූ එකතුව රු.1,830,450 ක් වූ අත්තිකාරම් 2016 සැප්තැම්බර් 21 දින වනවිට මාස 21 ක කාලයක් ගත වී තිබුණද පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රණවිරු සුහසාධනය නංවාලීමේ මූලික ව්‍යාපෘතියක් ලෙස සහනදායී පොලී අනුපාතය යටතේ රණවිරුවන් වෙත ණය ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂයට වෙන් කල රු.159,360,000 ක මුදලින් ලබාදී තිබුණේ රු.106,190,000 ක් පමණි. මේ අනුව ප්‍රතිපාදිත මුදලින් සියයට 33 ක් පමණ උපයෝජනය කර නොතිබුණි. තවද, 2014 වර්ෂයේදී සංසද, ස්වයං රැකියා, වෛද්‍ය හා ත්‍රීවිල් ණය සඳහා පුද්ගලයින් 552 ක් වෙනුවෙන් රු.130,680,000 ක් වැය කර ඇතත් 2015 වර්ෂයේදී පුද්ගලයින් 342 ක් සඳහා රු.84,060,000 ක් පමණක් ණය වශයෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. අධිකාරියේ වැඩ බලන සභාපතිවරයාගේ පැහැදිළි කිරීම අනුව ත්‍රි රෝද රථ සඳහා ණය ලබාදීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී නතර කර තිබුණු අතර අනෙකුත් ණය සඳහා සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් ලබාදුන් ණය ප්‍රමාණය සාපේක්ෂව පහල ගොස් තිබුණි.

## 4.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 වගන්තිය අනුව වැට් රහිතව රු. 40,000 ක මාසික බදු කුලී සීමාවකට යටත්ව වාහන කුලියට ලබා ගැනිමට අවසර ලබාදී තිබුණද ඊට පටහැනිව අධිකාරියේ උප සභාපතිනිය විසින් පාවිච්චි කළ අධිකාරියට අයත් මෝටර් රථය දුර ගමන් සඳහා සුදුසු නොවන බව සඳහන් කර 2015 ඔක්තෝබර් 15 දින සිට 2016 ජනවාරි 15 දින දක්වා කුලී පදනම මත මෝටර් රථයක් ලබාගෙන මසකට රු.70,000 බැගින් රු.210,000 ක් ගෙවා තිබුණි.

(ආ) අධිකාරියේ 2015 වර්ෂයට අදාල මූල්‍ය බලතල ප්‍රකාශය අනුව මුද්‍රා තබන ලද මිල ගණන් 03 කට නොඅඩු ප්‍රමාණයක් සඳහා භාණ්ඩ හා සේවා සඳහා මිල ගණන් කැඳවිය හැකි අනුමත උපරිම සීමාව රු.250,000 ක් විය. එයට පටහැනිව රණවිරු දින සැමරුම් උත්සවය වෙනුවෙන් අධිකාරියේ පිරිමි කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් මිලදී ගැනීමට රු.434,780 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සමාන පිරිවිතර මත අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙනුවට වැඩිම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙත ඇණවුම පිරිනැමීම හේතුවෙන් අධිකාරියට රු.231,760 ක අලාභයක් සිදු වී තිබුණි.

## 4.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජනාධිපති ලේකම්ගේ අංක පීසීඑම්ඩී/පීආර්/2013 හා 2013 ජුනි 05 දිනැති ලිපිය අනුව රාජ්‍ය ආයතනවල ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව අපහරණ ක්‍රියාවලියට අනුකූලව ඕරුවල වානේ සංස්ථාවට භාරදීමට කටයුතු කළ යුතු වුවත් වර්ෂ 03 සිට වර්ෂ 14 ක් දක්වා කාලයක් නිශ්ක්‍රීයව පැවති වෑන් රථ 03ක්, යතුරු පැදියක් සහ කැබ් රථ 02 ක් අධිකාරි පරිශ්‍රය තුළ තිබුණි. වැඩ බලන සභාපතිවරයාගේ පිළිතුර අනුව වාහන අපහරණය කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක පීඑෆ්ඩී/ජ්එස්ඩී/වීරිඑච්/**353(5)** vii හා 2014 නොවැම්බර් 04 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී තිබුණද එම ලිපියේ අදාල අපහරනයන් කළ යුත්තේ නව වාහන ලබා ගැනීමෙන් අනතුරුව බව දක්වා තිබීම හේතුවෙන් එම වත්කම් අපහරණය නොකළ බව සඳහන් කර තිබුණි.

(ආ) රණවිරුවන් හා ඔවුන්ගේ යැපෙන්නන් වෙත රණවිරු ප්‍රමුඛතා හැඳුනුම්පත් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2014 අගෝස්තු 25 දින මිලදී ගෙන තිබූ පිරිවැය රු.651,739 ක්වූ මුද්‍රණ යන්ත්‍රය සහ අනෙකුත් උපකරණ විගණන දිනය වූ 2016 අගෝස්තු 10 දින දක්වාම එම කාර්ය සඳහා යොදවා ගෙන නොතිබුණ අතර අභ්‍යන්තර හැඳුනුම්පත් මුද්‍රණය වෙනුවෙන් පමණක් භාවිතා කර තිබුණි.

(ඇ) 2015 පෙබරවාරි 26 දින රු.3,171,460 ක් වැය කරමින් රණවිරු සේවා අධිකාරිය විසින් පරිගණක 27 ක් හා මල්ටිමීඩියා යන්ත්‍රයක් වැඩිම මිල ඉදිරිපත් කළ රාජ්‍ය සංස්ථාවක් වෙතින් මිලදී ගෙන තිබූ අතර ඉන් රු.1,301,760 ක් වටිනා පරිගණක 12 ක්ද ඇතුළත්ව පාවිච්චි කළ හැකි තත්ත්වයේ පැවති පරිගණක 24 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට අධිකාරියේ ගබඩාව තුළ පැවති බව විගණනයේදී අනාවරණය විය. ඒ අනුව පරිගණක මිලදී ගැනීමේදි එම භාණ්ඩ වල අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා නොගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 5(ඈ) වගන්තිය අනුව නිලධාරීන් සේවයේ නියුක්ත කිරීමේ බලතල කළමනාකරණ මණ්ඩලය වෙත පවරා තිබූ නමුත් සභාපතිනිය විසින් සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් 11 දෙනෙකු තනතුරුවලට පත්කර එම්එම්-1-1-2006 වැටුප් ක්‍රමයේ පියවර 06 ක් ඉදිරියෙන් පිහිටුවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව විශ්‍රාමික පුද්ගලයන් දෙදෙනෙක් පරිපාලන නිලධාරී සහ උපදේශක තනතුරුවලට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන වාර්ෂික දීමනා ලෙස රු.566,250 ක් ගෙවා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ රණවිරු සේවා අධිකාරියේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලයෙන් විධායක ශ්‍රේණියේ තනතුරු 3 ක් එනම් අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් හා අභ්‍යන්තර විගණක යන නිලධාරින්ද, විධායක නොවන ශ්‍රේණියේ තනතුරු 30 ක් සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ තනතුරු 6 ක් ද ඇතුළු තනතුරු 39 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම අනුමත කාර්ය

මණ්ඩලය බඳවා ගැනීමකින් තොරව අනුමත නොවූ ව්‍යාපෘති සහකාර තනතුර සඳහා නිලධාරීන් පස් දෙනෙකු බඳවා ගෙන තිබුණි. ඉහත පුරප්පාඩු පැවතීම නිසා මූල්‍ය ප්‍රකාශන කලට වේලාවට ඉදිරිපත් කිරීමට නොහැකි වීමත් අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු මෙහෙය වීමත් සිදු වී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 ජුනි 14 වන දිනය.

### 5.2 ක්‍රියාකාරි සැලැස්ම

---------------------

ප්‍රවර්තන වර්ෂයට අදාල ඉලක්ක සපුරාලීම සඳහා අයවැය ප්‍රතිපාදන සලසා ගත යුතු වන අතර එම අරමුදල් වර්ෂය තුළ කාර්යක්ෂමව උපයෝගී කර ගැනීම සඳහා මූල්‍ය හා භෞතික ඉලක්කවල වගකීම නිශ්චය කොට ක්‍රියාකාරී සැලැස්මක් පිලියෙල කර කාලීනව තථ්‍ය ශේෂයන් සමඟ සසදා අවශ්‍ය සංශෝධන සහිතව අවශ්‍ය ඉලක්ක කරා මෙහෙයවිය යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී එවැනි අයවැය පාලනයක් සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් මෙහෙයවීමක් සිදුකර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

---------------------

රණවිරු සේවා අධිකාරියේ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණද, 2016 අගෝස්තු 03 විගණන දින වන විටත් එම තනතුරට පුද්ගලයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කරන ලද විගණන විමසුම් 4 ක් සඳහා පිළිතුරු සපයා නොතිබූ බව විගණනයේදී අනාවරණය විය.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------------

රණවිරු සේවා අධිකාරියේ 2015 වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.මිලියන 21.91 ක භාණ්ඩ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද අධිකාරියේ ප්‍රධාන අරමුණක් වන ආබාධිත රණවිරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් රෝද පුටු, අත්වාරු, කිහිලිකරු ලබා දීම වෙනුවෙන් කිසිදු ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

### 5.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාක් ක්‍රියාවලිය

-------------------------------------------

අධිකාරිය විසින් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් පරිදි ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය ක්‍රියාත්මක නොකර, රු.7,004,309 ක මුදලකට විදුලි සෝපානය මිලදී ගෙන සවිකිරීමේ කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පවරා තිබුණි. මු.රෙ. 237(ආ) අනුකූල නොවන ලෙස 2015 දෙසැම්බර් 31 දින මේ සඳහා රු.5,461,555 ක් විගණකාධිපතිවරයාගේ විගණනයට භාජනය නොවන යුධ හමුදා සුභසාධන අරමුදලට ගෙවා තිබුණි. මෙය යුධ හමුදාවේ පුද්ගලික අරමුදලක් වන අතර මු.රෙ 139(5) අනුව ආදායකයාගේ අනන්‍යතාවයද තහවුරු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| අ) ගිණුම්කරණය | අධිකාරියේ ගිණුම් අංශයේ කටයුතු ඉටු කිරීමේදී ගනුදෙණු ලෙජරය සහ මුදල් පොතේ සටහන් කිරීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම හා පරීක්ෂා කිරීම යනාදිය සම්බන්ධයෙන් මනා වැඩ බෙදීමක් සිදු කර නොතිබුණු අතර එකී කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය නියමිත පරිදි සිදුවී නොතිබුණි. |
| ආ) මුල්‍ය පාලනය | අත්තිකාරම් නිකුත් කිරීම, පියවීම හා ඒවා උපයෝජනය කිරීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු නොවීම. |
| ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| ඇ) අභ්‍යන්තර පාලනය | අධිකාරිය තුළ පවතින අංශයන්හි කාර්යයන් මනාව ක්‍රියාත්මක කරවීමට හැකි වන පරිදි මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබීම. |
| ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | භාණ්ඩ මිලදී ගැනීමේදී අදාල නීති රීති අනුගමනය කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. |